# කාර්ය සාධන වාර්තාව හා ගිණුම්

## வருடாந்த செயலாற்று அறிக்கையும் கணக்குகளும்

## *PERFORMANCE REPORT & ACCOUNTS*

# 2015



නිල්ල පිරුණු වෙල්ලස්සක් - තුටින් සපිරි ජනතාවක්

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොනරාගල පරිපාලන දිස්ත්‍රික්කය**

மாவட்டச் செயலகம் - மொனராகல நிருவாக மாவட்டம்

District Secretariat - Monaragala Administrative District

# පටුන


| | | | |
|---|---|---|---|
| 1 | 1.1 | දිස්ත්‍රික් ලේකම් තුමියගේ පණිවිඩය | - 01 |
| 2 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හැදින්වීම | | |
| | 2.1 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දැක්ම ,මෙහෙවර හා අරමුණු | - 02 |
| | 2.2 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ක්‍රියාකාරකම් | - 03 |
| 3 | දිස්ත්‍රික්කය හැදින්වීම | | |
| | 3.1 | දිස්ත්‍රික්කයේ සමාජ ආර්ථික පසුබිම | - 04 |
| | 3.2 | දිස්ත්‍රික් සිතියම | - 05 |
| | 3.3 | දිස්ත්‍රික්කයේ මූලික සංඛ්‍යානමය දත්ත | - 06 |
| 4 | සංවිධාන ව්‍යුහය හා අනුමත කාර්ය මණ්ඩලය | | |
| | 4.1 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංවිධාන ව්‍යුහය | - 07 |
| | 4.2 | සංවිධාන සැලැස්ම හා අනුමත කාර්ය මණ්ඩලය | - 08 |
| 5.1 | 2015 වර්ෂයේ කාර්යය සාධනය | | |
| | 5.1.1 | සපයනු ලබන සේවා සම්බන්ධ අවසාන නිමවුම් විස්තරය | - 09 |
| | 5.1.2 | සමාජ සේවා සැලසීම | - 10 |
| | 5.1.3 | ආදායම් ශීර්ෂයන් යටතේ එකතු කරනු ලැබූ ආදායම් | - 11 |
| | 5.1.4 | වර්ෂයේ මුදල් වාර්තා පිළිබඳ විස්තරය | - 12 |
| | 5.1.5 | 2015 ආපදා සහනසේවා සැපයීම | - 13 |
| | 5.1.6 | 2015 වර්ෂයේ නව ගොඩනැගිලි ඉදිකිරීම | - 14 |
| | 5.1.7 | වර්ෂය තුල ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් විස්තරය | - 15 |
| | 5.1.8 | දිවිනැගුම සහනාධාර සැපයීම | - 16 |
| | 5.1.9 | වෙනත් වැය ශීර්ෂ යටතේ වෙන් වූ ප්‍රතිපාදන හා වියදම් විස්තර | - 17 |
| | 5.1.10 | රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් " බී " ගිණුම් විස්තර | - 18 |
| 5.2 | වාර්ෂික ගිණුම් | | |
| | 5.2.1 | රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් " බී " ගිණුම | - 19 |
| | 5.2.2 | පොදු තැන්පත් ගිණුම | - 20 |
| | 5.2.3 | පුනරාවර්ථන හා මූලධන වියදම් සාරාංශය | - 21 |
| | 5.2.4 | ව්‍යාපෘති අනුව පුනරාවර්ථන වියදම් | - 22 |
| | 5.2.5 | ව්‍යාපෘතිය අනුව මූලධන වියදම් - ව්‍යාපෘති - 1 | - 23 |
| | 5.2.6 | ව්‍යාපෘතිය අනුව මූලධන වියදම් - ව්‍යාපෘති - 2 | - 24 |
| | 5.2.7 | වියදම් මූල්‍යකරණ සාරාංශය වැඩසටහන අනුව | - 25 |
| | 5.2.8 | වියදම් මූල්‍යකරණ සාරාංශය ව්‍යාපෘතිය අනුව | - 26 |

# දිස්ත්‍රික් ලේකම්/දිසාපතිතුමියගේ පණිවුඩය ............



දිස්ත්‍රික්කයේ ජනතාවගේ සේවා අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

දිවයිනේ දෙවන විශාලතම දිස්ත්‍රික්කය වන මොනරාගල දිස්ත්‍රික්කය අනෙක් දිස්ත්‍රික්ක හා සසඳන කල සාපේක්ෂව අඩු පහසුකම් සහිත දිස්ත්‍රික්කයකි. දිස්ත්‍රික්කයේ සංවර්ධනය සඳහා රජය විසින් ගෙන යනු ලබන ක්‍රියාමාර්ග හා යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති මගින් මෙම දිස්ත්‍රික්කය සතුටුදායක සංවර්ධනයකට ප්‍රවිෂ්ටවී ඇති බව සතුටින් ප්‍රකාශ කරමි.

දිස්ත්‍රික්කයේ සංවර්ධනය සඳහා විවිධ අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු,පළාත් සභා හා අනෙක් රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන මගින් විශාල මුදල් ප්‍රමාණයක් වාර්ෂිකව ආයෝජනය කරනු ලබයි.පසුගිය වර්ෂයේද ඒ තුලින් විශාල භෞතික හා සේවාභිමුඛ සංවර්ධනයක් ජනතාව වෙත ළඟාකර දීමට හැකි වූ බව මේ අවස්ථාවේ අභිමානයෙන් යුතුව සඳහන් කරමි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කේන්ද්‍රකර ගනිමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් දිස්ත්‍රික්කයේ සාමාන්‍ය පරිපාලනය ශක්තිමත් කිරීමෙන් ජනතාව වෙත සමාජ සේවා කටයුතු පුළුල් කිරීමත්, මධ්‍යම රජයේ සහ පළාත් සංවර්ධන වැඩසටහන් ඇතුළු විවිධ සංවර්ධන ක්‍රමෝපායන් හරහා දිස්ත්‍රික්කයේ සංවර්ධනය කටයුතු සඳහා සම්බන්ධීකරණයේ නියමුවා වන්නේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයයි.තවද අතිගරු ජනාධිපතිතුමන්ගේ "මෛත්‍රී පාලනයක් ස්ථාවර රටක් " යන ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව ක්‍රියාත්මක කරනු ලබන ප්‍රමුඛ වැඩසටහන් වන ජාතික ආහාර නිෂ්පාදනය,මත්ද්‍රව්‍ය නිවාරණය,වකුගඩු රෝග නිවාරණය, සහ පරිසර සංරක්ෂණය යන සිව් වැදෑරුම් වැඩසටහන් වලට අදාලව දිස්ත්‍රික්කයක් වශයෙන් ඉලක්කයන් සහිතව සම්බන්ධීකරණය සහ මෙහෙය වීමේ කාර්යභාරය තුලට ප්‍රවිෂ්ට වීමට හැකිවීම මහත් භාග්‍යයක් කොට සලකමි.

එබැවින් එම කටයුතු වලට මඟපෙන්වීමක් ලෙස 2015 වර්ෂයට අදාල "කාර්ය සාධන වාර්තාව හා ගිණුම් " නම් මෙම ප්‍රකාශය එළිදැක්වීමට හැකිවීම ගැන මා බෙහෙවින් සතුටට පත්වෙමි.

ඩී.එස්.පත්මකුලසූරිය,

දිසාපති/ දිස්ත්‍රික් ලේකම්,

මොනරාගල දිස්ත්‍රික්කය.

# *අපේ තේමාව*

# *"නිල්ලපිරුණු වෙල්ලස්සක් තුටින් සපිරි ජනතාවක් "*

# *අපේ දැක්ම*

## යහපාලනය තුලින් තිරසාර සංවර්ධනයකට දායක වෙමින් රාජ්‍ය සේවයේ විශිෂ්ඨත්වයට

## මෙහෙවර

*දිස්ත්‍රික්කය හා එහි ජනතාව ජාතික සංවර්ධනයට දායකවන පරිදි තිරසාර සංවර්ධනයක් උදෙසා රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලවූ මනා සැලැස්මකින් යුතුව සම්පත් හා ආයතන ඵලදායි ලෙස මෙහෙයවන්නාවූ මනා සම්බන්ධීකරණයක් තුළින් ජනතා අවශ්‍යතා කාර්යක්ෂමව , සාධාරණව යුක්තිගරුකව හා මිත්‍රශීලීව ඉටුකිරීම*

## *අපේ අරමුණු*

**1** **ප්‍රාදේශීය පරිපාලනය සක්‍රියව, ශක්තිමත්ව පවත්වාගෙන යාම සඳහා ජාතික මට්ටමේ ආයතන සමඟ සම්බන්ධීකරණය හා කාර්යයන් පහසු කරණය.**

**2** **විනිවිද භාවයෙන් යුතු කාර්යක්ෂම හා ඵලදායි රාජ්‍ය සේවාවක් තුළින් දිස්ත්‍රික්කයේ මහජන අවශ්‍යතා සපුරාලීම.**

**3** **දිස්ත්‍රික්කයේ රාජ්‍ය සේවකයින් මහජන අවශ්‍යතාවයන් පිළිබඳ සංවේදීව ක්‍රියාත්මක වීමට සමත් ආකල්ප වලින් පෝෂණය කිරීම.**

**4** **විධිමත්ව හා කාර්යක්ෂමව පරිපාලන කටයුතු ක්‍රියාත්මක කිරීමට යෝග්‍යවන පරිදි දිස්ත්‍රික්කයේ මානව හා භෞතික සම්පත් මෙහෙයවීම හා කළමනාකරණය කිරීම.**

**5** **දිස්ත්‍රික්කයේ රාජ්‍ය ආදායමට බැරවිය යුතු සියලු ආදායම් නිසි කලට, නිසි පරිදි එක්රැස් කර දීම.**

**6** **රාජ්‍ය නොවන සංවිධානවල කටයුතු, විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීම මඟින් දිස්ත්‍රික්කයට ගලා එන සම්පත් වඩාත් ඵලදායි ලෙස යෙදවීම සහතික කිරිම.**

**අපගේ ක්‍රියාකාරකම් ...........**

1 ප්‍රාදේශීය පරිපාලනය හා සම්බන්ධීකරණය

2 සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

3 නියාමන කටයුතු ඉටු කිරීම.

4 ආපදා කළමනාකරණය හා සහන කටයුතු

5 සමාජ සුභසාධන වැඩසටහන් සිදු කිරීම.

6 රාජ්‍ය ආදායම් රැස් කිරීම්.

7 ආගමික හා සංස්කෘතික කටයුතු සිදු කිරීම.

8 මධ්‍යම රජයේ රේඛීය අමාත්‍යාංශ හා ව්‍යවස්ථාපිත අධිකාරී වල දිස්ත්‍රික් අධිකාරීත්වය දැරීම.

9 රාජ්‍ය සේවය ප්‍රතිනිර්මාණය කිරීම සඳහා වන වැඩසටහන් සකස් කිරීම.

10 රාජ්‍ය නොවන සංවිධාන හා පුද්ගලික අංශයේ ක්‍රියාකාරීත්වයන් අධීක්ෂණය හා සම්බන්ධීකරණය කිරීම.


*මොනරාගල දිස්ත්‍රික්කය ...................*

අතීතයේදී වෙල්ලස්ස ලෙස හැඳින්වූ මොනරාගල දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ නැගෙනහිර හා ගිණිකොණ දිශානුගතව ඌව පළාත තුල පිහිටා ඇත.මුළු බිම් ප්‍රමාණය වර්ග කිලෝමීටර් **5959** ක් වන අතර ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම දිස්ත්‍රික්කය වේ. නිරපේක්ෂ පිහිටීම අනුව උතුරු අක්ෂාංශ **6° 17'** ත් **7° 28'** ත් සහ නැගෙනහිර දේශාංශ **80° 50'** ත් **81° 35'** ත් අතර පිහිටා ඇති ස්වභාවික සම්පත් වලින් අනූන භූමි ප්‍රදේශයකි. මෙම දිස්ත්‍රික්කය නැගෙනහිරින් හා උතුරින් අම්පාර දිස්ත්‍රික්කයෙන්ද බටහිරින් හා උතුරින් බදුල්ල දිස්ත්‍රික්කයෙන්ද දකුණින් හම්බන්තොට දිස්ත්‍රික්කයෙන්ද නිරිතදිගින් රත්නපුර දිස්ත්‍රික්කයෙන්ද මායිම් වී ඇත.මෙම දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ **11** කින් හා ග්‍රාම නිළධාරි වසම් **319** කින් ද ගම්මාන **1324** කින් සහ ප්‍රාදේශීය සභා **10** කින් සමන්විත වේ.

සමස්ථයක් වශයෙන් මොනරාගල දිස්ත්‍රික්කය දේශගුණික කලාප බෙදීම අනුව අන්තර් මධ්‍ය දේශගුණික කලාපයට හා වියළි කලාපයට අයත්වේ. දිස්ත්‍රික්කයෙන් **70 %** ක් පමණ වියළි දේශගුණික කලාපයට අයත් අතර මෙහි විශේෂත්වයක් වන්නේ දිස්ත්‍රික්කය මධ්‍යයේ පිහිටි මරගල කඳුවැටිය ආශ්‍රිත ප්‍රදේශය තෙත් කලාපීය දේශගුණික ලක්ෂණ පෙන්වයි.මෙය මෙරට තුල පිහිටි සුවිශේෂී වූ දේශගුණික කලාපයකි. දිස්ත්‍රික්කයේ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මි.මි. **1625** ක් පමණ වන අතර දිස්ත්‍රික්කයේ මධ්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙල්සියස් **26°** ක් පමණ වේ.මෙම දිස්ත්‍රික්කයේ **2015** වර්ෂයේ සමස්ථ ජනගහනය **472,000** ක් පමණ වන අතර එයින් පිරිමි ජනගහණය **235,000** ක් සහ ස්ත්‍රී ජනගහණය **237,000** ක් වේ. දිස්ත්‍රික්කයේ සමස්ථ පවුල් සංඛ්‍යාව **138,823** ක් පමණ ජීවත් වේ.

මෙම දිස්ත්‍රික්කයේ ඓතිහාසික වටිනාකමකින් යුතු වැදගත් ස්ථාන රැසක් පිහිටා ඇත.ඒ අතර රුහුණු මහා කතරගම දේවාලය, කතරගම කිරිවෙහෙර, මාළිගාවිල, යුදගනාව, බුදුරුවගල ආදී ස්ථාන සුවිශේෂී වේ.සේනානායක සමුද්‍රය,වෙහෙරගල සහ උඩවලව වැනි විශාල ජලාශයන් මෙම දිස්ත්‍රික්කය තුල පිහිටා ඇත.

බ්‍රිතාන්‍ය යටත් විජිතයක්ව පැවතීමට පෙර වෙල්ලස්ස නමින් හැඳින්වූ මෙම ප්‍රදේශය භවබෝග වලින් ස්වයංපෝෂිතව කෘෂිකර්මාන්තය අතින් ඉතා දියුණු මට්ටමක පැවති බවට සාධක තිබේ. බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ දී සිදුකරන ලද විශාල විනාශයන්ගේ ප්‍රතිඵලයක් ලෙස මෙම ප්‍රදේශය පසුගාමී තත්වයක පැවතියද, පසුකාලීන රජයන් විසින් සිදුකරන ලද විවිධ සංවර්ධන ක්‍රමෝපායන් තුළින් දිස්ත්‍රික්කය යම් පිබිදීමක් දක්නට ඇත.



Map In Monaragala District
Madulla
Bibila
Madagama
Badalkumbura
Monaragala
Siyambalanduwa
Buthtala
Wellawaya
Tanamavila
Kataragama
Sewanagala

# දිස්ත්‍රික්කයේ මූලික සංඛ්‍යාන දත්ත

## 1. පරිපාලන දත්ත

| | | |
|---|---|---|
| දිස්ත්‍රික්කයේ නම | : | මොනරාගල |
| පළාත | : | ඌව පළාත |
| මුළු වර්ග ප්‍රමාණය (වර්ග කිලෝමීටර් ) | : | 5959 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | : | 11 |
| ග්‍රාම නිලධාරි කොට්ඨාශ ගණන | : | 319 |
| ඡන්ද කොට්ඨාශ ගණන | : | 03 |
| මහ නගර සභා ගණන | : | නැත |
| නගර සභා ගණන | : | නැත |
| ප්‍රාදේශීය සභා ගණන | : | 10 |
| කලාප අධ්‍යාපන කාර්යාල ගණන | : | 03 |
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සංඛ්‍යාව | : | 06 |
| පළාත් සභා මන්ත්‍රීවරු සංඛ්‍යාව | : | 12 |
| ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු සංඛ්‍යාව | : | 104 |
| ලියාපදිංචි ඡන්දදායකයින් සංඛ්‍යාව | : | 350476 |
| දිස්ත්‍රික්කයේ මුළු පවුල් සංඛ්‍යාව | : | 138823 |
| දිස්ත්‍රික්කයේ මුළු නිවාස සංඛ්‍යාව | : | 131111 |
| මුළු ජනගහණය | : | 472000 |
| ජනගහණ වර්ධන අනුපාතය | : | 1.1% |
| උපත් අනුපාතය (දහසකට) | : | 17.9 |
| මරණ අනුපාතය (දහසකට) | : | 4.7 |
| සජීවී උපත් සංඛ්‍යාව | : | 7175 |
| දිස්ත්‍රික්කයේ සමෘද්ධිලාභීන් සංඛ්‍යාව | : | 46642 |
| දිස්ත්‍රික්කයේ විශ්‍රාමිකයින් සංඛ්‍යාව | : | 6944 |

# මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංවිධාන සටහන



## දිස්ත්‍රික් ලේකම් මඟින් සැපයෙන සේවාවන්ට සම්බන්ධ සංවිධාන ව්‍යුහය

**1** **දිස්ත්‍රික් ලේකම්**
**(දිස්ත්‍රික් මට්ටමින්)**

⇩

**ප්‍රාදේශීය ලේකම්**
**(ප්‍රාදේශීය ලේකම් කාර්යාල)**

⇩

**ග්‍රාම නිලධාරි**
**(ග්‍රාම නිලධාරි වසම් 319)**

**2** **ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

1 බිබිල
2 මැදගම
3 මඩුල්ල
4 සියඹලාණ්ඩුව
5 මොනරාගල
6 බඩල්කුඹුර
7 බුත්තල
8 වැල්ලවාය
9 තණමල්විල
10 කතරගම
11 සෙවනගල

## රැකියා පැතිකඩ - 2015

| කාණ්ඩය | අනුමත කාර්ය මණ්ඩලය | සත්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|
| **ස්ථිර** | | | |
| මාණ්ඩලික ශ්‍රේණිය | **40** | **32** | **8** |
| තෘත්‍රීක ශ්‍රේණිය | **23** | **1** | **22** |
| ද්විතීක ශ්‍රේණිය | **741** | **663** | **78** |
| ප්‍රාථමික ශ්‍රේණිය | **110** | **103** | **7** |
| **තාවකාලික / අනියම්** | | | |
| මාණ්ඩලික ශ්‍රේණිය | - | - | - |
| ද්විතීක ශ්‍රේණිය | **-** | - | - |
| ප්‍රාථමික ශ්‍රේණිය | **-** | - | - |
| එකතුව | **914** | **799** | **115** |

# සපයනු ලබන සේවාවන්හි අවසාන නිමැවුම පිළිබඳ විස්තර - 2015

## 1). බලපත්‍ර වර්ගය

| අනු අංකය | බලපත්‍රයේ ස්වභාවය | නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|
| 1 | රියදුරු බලපත්‍ර (නව) | 12984 |
| 2 | රියදුරු බලපත්‍ර ( අලුත් කිරීම්) | 2357 |
| 3 | රිය අනතුරු පරීක්ෂා කිරීම | 703 |
| 4 | යතුරුපැදි ලියාපදිංචි කිරීම | 3669 |
| 5 | රා බලපත්‍ර | 17 |
| 6 | ලියාපදිංචි කළ කර්මාන්ත සංඛ්‍යාව | 563 |
| 7 | ආදායම් බලපත්‍ර | 20354 |
| 8 | තක්සේරු සහතික | 181 |
| 9 | දැව ප්‍රවාහන කිරීමේ බලපත්‍ර | 3876 |
| 10 | කැනීම් බලපත්‍ර | 340 |
| 11 | වාහන බලපත්‍ර | 34075 |
| 12 | ලී බඩු ප්‍රවාහනය කිරීමේ බලපත්‍ර | 19 |
| 13 | වැලි ප්‍රවාහනය කිරීමේ බලපත්‍ර | 8031 |
| 14 | ගල්වල බලපත්‍ර | 98 |
| 15 | සතුන් ප්‍රවාහනය කිරීමේ බලපත්‍ර | 792 |
| 16 | විදේශ ගමන් බලපත්‍ර | 86 |
| 17 | මත්පැන් බලපත්‍ර (අලුත් කිරීම්) | 62 |
| 18 | ගිණි අවි බලපත්‍ර (අලුත් කිරීම්) | 626 |

## 2). ඉඩම් තොරතුරු

| | | |
|---|---|---|
| 1 | ඉඩම් බලපත්‍ර | 2015 |
| 2 | ජයභූමි | 44 |
| 3 | ඉසුරුභූමි | 27 |
| 4 | රත්නභූමි / රන්බිම | 1218 |
| 5 | ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කර ඇති බලපත්‍ර | 233 |

# සමාජ සේවා සැලසීම - 2015

| අනු අංකය | ආධාර වර්ගය | සංඛ්‍යාව |
|---|---|---|
| **1** | අනියම් ආධාර | **2035** |
| **2** | මහජන ආධාර | **152** |
| **3** | ක්ෂයරෝගීන් සඳහා ආධාර | **45** |
| **4** | පිළිකා රෝගාධාර | **1155** |
| **5** | තැලසීමියා රෝගාධාර | **287** |
| **6** | වකුගඩු රෝගාධාර | **347** |
| **7** | ලාදුරු රෝගාධාර | **2** |
| **8** | සමාජ ආරක්ෂණ | **506** |
| **9** | රෝද පුටු | **108** |
| **10** | ත්‍රියිසිකල් | **5** |
| **11** | ඇස් කණ්ණාඩි | **604** |
| **12** | අක්ෂි සායන | **29** |
| **13** | ශ්‍රවන උපකරණ | **82** |
| **14** | හදිසි ආපදා ආධාර | **750** |
| **15** | ආබාධිතයින් සඳහා ස්වයං රැකියා | **68** |
| **16** | ආබාධිතයින් සඳහා වෘත්තීය පුහුණු | **43** |
| **17** | නිවාස ආධාර | **175** |
| **18** | ගර්භණී මාතාවන් සඳහා ආධාර | **11516** |
| **19** | වැඩිහිටි දීමනා | **10242** |
| **20** | හැඳුනුම්පත් නිකුත් කිරීම | **5080** |
| **21** | ජනාධිපති අරමුදල් රැස්කිරීම් | **33** |

# ආදායම් ලැබීම් - 2015

| ආදායම් සංකේතය | ආදායම් විස්තරය | රැස්කළ ආදායම් රු. |
| --- | --- | --- |
| **1003 -07-02** | රෙජිස්ට්‍රාර් ගාස්තු | **11,655,848.00** |
| **1003-07-03** | දැව ප්‍රවාහන ගාස්තු | **823,494..32** |
| **1003-07-05** | බලපත්‍ර ගාස්තු | **190,928..30** |
| **1003-07-99** | අනෙකුත් ගාස්තු | **3,581,325.33** |
| **2002-01-01** | රජයේ ගොඩනැගිලි කුළී | **2,055,052.94** |
| **2002-01-03** | ඉඩම් හා අනෙකුත් බදුකුළී | **799,628.00** |
| **2002-02-99** | ණය පොළී - වෙනත් | **4,105,938.73** |
| **2003-02-03** | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු | **10,750.00** |
| **2003-02-13** | විභාග හා අනෙකුත් ගාස්තු | **33,020.00** |
| **2003-02-14** | මෝටර් රථ - අනෙකුත් ගාස්තු | **38,992,720.00** |
| **2003-02-99** | විවිධ ලැබීම් | **155,421.70** |
| **2003-03-02** | දඩ මුදල් හා රාජ සන්තක කිරීම් | **548,606.77** |
| **2003-04-00** | විවිධ ආදායම් | **-660,000.00** |
| **2003-99-00** | අනෙකුත් ලැබීම් | **58,469,127.31** |
| **2004-01-00** | සමාජ සංරක්ෂණ දායක මුදල් | **16,500,633.93** |
| | එකතුව | **137,262,495.33** |

# මුදල් වාර්තා විස්තරය - 2015

## මුදල් ලැබීම් සහ ගෙවීම්

| මාසය | මහා භාණ්ඩාගාරයෙන් අක්මුදල් ලැබීම් (රු.මි.) | වෙනත් ලැබීම් (රු.මි.) | මුදල් ගෙවීම් (රු.මි.) | ඉතිරිය /අතිරික්තය (රු.මි.) |
|---|---|---|---|---|
| ජනවාරි | **281.7** | **137.4** | **77.2** | **341.9** |
| පෙබරවාරි | **392.0** | **18.5** | **173.4** | **237.1** |
| මාර්තු | **305.3** | **69.0** | **154.8** | **219.5** |
| අප්‍රේල් | **330.8** | **128.5** | **250.7** | **208.6** |
| මැයි | **278.0** | **9.4** | **83.8** | **203.6** |
| ජුනි | **373.3** | **12.0** | **79.0** | **306.3** |
| ජුලි | **722.5** | **11.4** | **210.5** | **523.4** |
| අගෝස්තු | **649.3** | **14.3** | **241.3** | **422.3** |
| සැප්තැම්බර් | **536.6** | **15.5** | **154.4** | **397.7** |
| ඔක්තෝබර් | **573.7** | **17.3** | **167.6** | **423.4** |
| නොවැම්බර් | **491.8** | **12.3** | **263.3** | **240.8** |
| දෙසැම්බර් | **687.2** | **63.1** | **750.3** | **0.0** |

## 2015 වර්ෂයේ ආපදා සහනසේවා සැපයීම
## දිස්ත්‍රික් ආපදා සහනසේවා මධ්‍යස්ථානය - මොනරාගල

| | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | පූර්ණ නිවාස හානි ගණන | ලබාදුන් ආධාර මුදල් ප්‍රමාණය රු. | අර්ධ නිවාස හානි ගණන | ලබාදුන් ආධාර මුදල් ප්‍රමාණය රු. | මුළු ආධාර මුදල් ප්‍රමාණය රු. |
|---|---|---|---|---|---|---|
| 1 | මඩුල්ල | 24 | 712,500.00 | 7 | 86,000.00 | 798,500.00 |
| 2 | සියඹලාණ්ඩුව | - | - | 58 | 500,000.00 | 500,000.00 |
| 3 | මොනරාගල | 1 | 100,000.00 | 12 | 300,000.00 | 400,000.00 |
| 4 | බඩල්කුඹුර | 8 | 229,500.00 | 57 | 50,500.00 | 280,000.00 |
| 5 | බුත්තල | - | - | 23 | 200,000.00 | 200,000.00 |
| 6 | වැල්ලවාය | 42 | 1,020,000.00 | - | - | 1,020,000.00 |
| 7 | තණමල්විල | - | - | 10 | 100,000.00 | 100,000.00 |
| 8 | කතරගම | 3 | 100,000.00 | - | - | 100,000.00 |
| | එකතුව | 78 | 2,162,000.00 | 167 | 1,236,500.00 | 3,398,500.00 |

## 2015 වර්ෂයේ ගොඩනැගිලි ඉදිකිරීම් - 277 වැය ශීර්ෂය

| අනු අංකය | ගොඩනැගිලි ඉදිකිරීම | මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලි. | 2015 වර්ෂය තුල ලැබුන මුළු ප්‍රතිපාදන රු.මිලි. | 2015 වර්ෂය තුල මුළු වියදම රු.මිලි. | ප්‍රගතිය % | |
|---|---|---|---|---|---|---|
| | | | | | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
| 1 | සියඹලාණ්ඩුව නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම - 2 අදියර | 35.00 | 17.40 | 9.40 | 54 | 100 |
| 2 | ක්ෂේත්‍ර නිළධාරි කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම - බඩල්කුඹුර | 5.07 | 5.07 | 4.70 | 93 | 100 |
| 3 | ගබඩාව ඉදිකිරීම - සෙවනගල | 1.50 | 1.50 | 1.50 | 100 | 100 |
| 4 | ගරාජය ඉදිකිරීම - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 3.53 | 3.50 | 3.27 | 93 | 100 |
| 5 | නව දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ ඉතිරි ගෙවීම් | 467.86 | 6.26 | 6.26 | 100 | 100 |

## 2015 වර්ෂයේ ගොඩනැගිලි ඉදිකිරීම් - වෙනත් දෙපාර්තමේන්තු

| අනු අංකය | ගොඩනැගිලි ඉදිකිරීම | මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලි. | 2015 වර්ෂය තුල ලැබුන මුළු ප්‍රතිපාදන රු.මිලි. | 2015 වර්ෂය තුල මුළු වියදම රු.මිලි. | ප්‍රගතිය % | |
|---|---|---|---|---|---|---|
| | | | | | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
| 1 | නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම - වැල්ලවාය. | 27.40 | 25.62 | 24.32 | 95 | 100 |
| 2 | දිවා සුරැකුම් මධ්‍යෂ්ඨානය ඉදිකිරීම - මොනරාගල | 11.30 | 10.00 | 9.31 | 93 | 100 |
| 3 | බිබිල පොලිස් ළමා හා කාන්තා කාර්යංශ ගොඩනැගිල්ල ඉදිකිරීම. | 4.99 | 5.00 | 4.19 | 84 | 100 |
| 4 | සියඹලාණ්ඩුව පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ ගොඩනැගිල්ල ඉදිකිරීම. | 4.99 | 5.00 | 4.14 | 83 | 100 |
| 5 | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම . | 21.83 | 21.83 | 4.35 | 20 | 40 |

## 2015 වර්ෂයේ ක්‍රියාත්මක කල සංවර්ධන වැඩසටහන්

| අනු අංකය | වැඩසටහන් | අනුමත ව්‍යාපෘති ගණන | ලැබුන ප්‍රතිපාදන රු.මිලි. | 2015.12.31 දිනට වියදම රු.මිලි. | 2015.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| 1 | දොරින් දොරට ගමින් ගමට ගම් 15000 ක් නගා සිටුවීමේ වැඩසටහන - 2015 | 516 | 319.00 | 313.82 | 98 |
| 2 | දොරින් දොරට ගමින් ගමට වැඩසටහන විශේෂ ව්‍යාපෘති -2015 | 6 | 4.43 | 4.30 | 97 |
| 3 | ග්‍රාමීය ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහන 2015 | 1 | 1.00 | 1.00 | 100 |
| 4 | 2014 වර්ෂයේ ක්‍රියාත්මක කර 2015 වර්ෂයට අවිච්ඡේද වූ ව්‍යාපෘති | 178 | 161.82 | 156.55 | 97 |
| | එකතුව | 701 | 486.25 | 475.68 | 98 |

# 2015 දිවිනැගුම සහනාධාර නිකුත් කිරීම

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | රු.3500/- | රු.2500/- | රු.1500/- | රු.420/- | එකතුව | මුළු වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|
| බිබිල | **1254** | **691** | **1218** | **1123** | **4286** | **8,415,160** |
| මඩුල්ල | **1313** | **564** | **1174** | **853** | **3904** | **8,124,760** |
| මැදගම | **1483** | **735** | **1148** | **788** | **4154** | **9,080,960** |
| සියඹලාණ්ඩුව | **2113** | **816** | **1194** | **1280** | **5403** | **11,764,100** |
| මොනරාගල | **1975** | **797** | **1380** | **438** | **4590** | **11,158,960** |
| බඩල්කුඹුර | **3060** | **1369** | **1808** | **588** | **6825** | **17,091,460** |
| වැල්ලවාය | **1670** | **660** | **1590** | **760** | **4680** | **10,199,200** |
| බුත්තල | **2625** | **1110** | **1671** | **470** | **5876** | **14,666,400** |
| තණමල්විල | **1512** | **587** | **759** | **433** | **3291** | **8,079,860** |
| සෙවනගල | **1222** | **380** | **374** | **397** | **2373** | **5,954,740** |
| කතරගම | **488** | **203** | **469** | **100** | **1260** | **2,961,000** |
| එකතුව | **18715** | **7912** | **12785** | **7230** | **46642** | **107,496,600** |

# 2015 වර්ෂයේ වෙනත් දෙපාර්තමේන්තු වලින් කරන ලද වියදම්

| වැය ශීර්ෂය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | පුනරාවර්තන වියදම් රු: | මූලධන වියදම රු: |
|---|---|---|---|
| 001 | ජනාධිපති කාර්යාලය | | 230087 |
| 101 | බුද්ධශාසන අමාත්‍යාංශය | | 1256520 |
| 102 | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | 2253516 | |
| 103 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | 9700 | |
| 104 | ප්‍රතිපත්ති සම්පාදක ආර්ථික කටයුතු අමාත්‍යාංශය | 160933605 | 1422783 |
| 106 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 5244514 | 8054182 |
| 110 | අධිකරණ අමාත්‍යාංශය | 4350440 | |
| 111 | සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 3000 | 16594 |
| 118 | වාරිමාර්ග හා කෘෂිකර්ම අමාත්‍යාංශය | 15430072 | 1121819 |
| 120 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 29514081 | 17354364 |
| 121 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 25245960 | 183163734 |
| 123 | නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය | | 319081877 |
| 124 | සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය | 229034448 | 2044991 |
| 130 | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය | 9107883 | 21690890 |
| 153 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 981812 | 76788476 |
| 155 | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 162500 | |
| 157 | ජාතික සහජීවන,සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය | 502541 | 743260 |
| 163 | අභ්‍යන්තර කටයුතු සහ වයඹ සංවර්ධන අමාත්‍යාංශය | | 331357 |
| 181 | ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 1174367 | |
| 182 | විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශය. | 13653129 | 389396 |
| 196 | විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 407010 | 444233 |
| 197 | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 46293 | |
| 198 | වාරිමාර්ග අමාත්‍යාංශය | 35414 | 132580 |
| 201 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | 5539085 | 4877042 |
| 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 180870 | 27950 |
| 210 | ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 8000 | 84515 |
| 216 | සමාජසේවා දෙපාර්තමේන්තුව | 6012682 | 891783 |
| 217 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 7716800 | 82200 |
| 227 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 9337037 | |
| 252 | ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | 954293 | 448830 |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 11070884 | |
| 254 | රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | 1190189 | |
| 282 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | | 12861224 |
| 284 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | | 3965617 |
| 285 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | | 4396259 |
| 286 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 10407682 | 596381 |
| 287 | ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව | | 205006 |
| 300 | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | 417956 | |
| 307 | මෝටර් රථ දෙපාර්තමේන්තුව | 658985 | 1212440 |
| 311 | ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | | 53722 |
| 326 | ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව | 111266 | |
| 327 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | 223736 | 1136079 |
| 328 | මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | 356838 | 520454 |
| 401 | සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | | 561000 |
| 402 | තරුණ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය | 115492 | 294640 |
| 403 | සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 53775417 | 238200 |
| 408 | උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍යාංශය | 919880 | 441704 |
| | එකතුව | 607087377 | 667162188 |

# රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම - 2015

| කාර්යාලය | ණයගැති භාවයෙන් මිදීම | | | ආපදා | | | උත්සව | | | විශේෂ | | | වෙනත් | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අයදුම්කළ සං: | ගෙවන ලද සං: | මුදල | අයදුම්කළ සං: | ගෙවන ලද සං: | මුදල | අයදුම්කළ සං: | ගෙවන ලද සං: | මුදල | අයදුම්කළ සං: | ගෙවන ලද සං: | මුදල | අයදුම්කළ සං: | ගෙවන ලද සං: | මුදල |
| දි.ලේ.කා | - | - | - | 29 | 29 | 1,488,354 | 53 | 53 | 525,000 | 13 | 13 | 52,000 | - | - | - |
| බිබිල | - | - | - | 18 | 18 | 712,070 | 70 | 70 | 700,000 | 37 | 37 | 148,000 | - | - | - |
| මැදගම | - | - | - | 23 | 17 | 1,055,500 | 61 | 61 | 610,000 | 30 | 30 | 120,000 | - | - | - |
| මඩුල්ල | - | - | - | 23 | 23 | 1,781,746 | 64 | 64 | 640,000 | 22 | 22 | 88,000 | - | - | - |
| සියඹලාණ්ඩුව | - | - | - | 38 | 38 | 3,385,694 | 62 | 62 | 620,000 | 5 | 5 | 20,000 | - | - | - |
| බඩල්කුඹුර | - | - | - | 15 | 15 | 1,173,710 | 66 | 66 | 660,000 | 29 | 29 | 116,000 | - | - | - |
| මොනරාගල | - | - | - | 28 | 28 | 1,659,218 | 58 | 58 | 410,500 | 27 | 27 | 108,000 | 1 | 1 | 6,000 |
| බුත්තල | - | - | - | 15 | 15 | 1,701,915 | 81 | 81 | 495,000 | 27 | 27 | 108,000 | - | - | - |
| වැල්ලවාය | - | - | - | 15 | 15 | 1,191,811 | 53 | 53 | 530,000 | 5 | 5 | 20,000 | - | - | - |
| තණමල්විල | - | - | - | 23 | 23 | 1,498,140 | 40 | 40 | 400,000 | 5 | 5 | 20,000 | - | - | - |
| කතරගම | - | - | - | 17 | 17 | 1,104,250 | 22 | 22 | 220,000 | 9 | 9 | 44,000 | - | - | - |
| සෙවනගල | - | - | - | 29 | 29 | 1,039,764 | 45 | 45 | 450,000 | | | | - | - | - |
| එකතුව | - | - | - | 273 | 267 | 17,792,172 | 675 | 675 | 6,260,500 | 209 | 209 | 844,000 | 1 | 1 | 6,000 |

# රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බි" ගිණුම - 2015

| ගිණුමේ නම | ගිණුම් අංකය | 2015/01/01 දිනට ආරම්භක ශේෂය | වර්ෂය තුළ හර කිරීම් | වර්ෂය තුළ බැර කිරීම් | දෙපාර්තමේන්තු පොත් අනුව 2015/12/31 දිනට අවසාන ශේෂය | භාණ්ඩාගාර පොත් අනුව 2015/12/31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බි ගිණුම | 8493/0/0/0277/0011 | 99,167,514.62 | 25,742,314.00 | 30,743,236.98 | 94,166,591.64 | 94,166,591.64 |
| | 8493/0/0/0277/0012 | 0.00 | 4,710,360.49 | 5,968,517.00 | 1,258,156.51 | 1,258,156.51 |

# පොදු තැන්පත් ගිණුම් - 2015

| ගිණුමේ නම | ගිණුම් අංකය | 2015/01/01 දිනට ආරම්භක ශේෂය | වර්ෂය තුළ හර කිරීම් | වර්ෂය තුළ බැර කිරීම් | 2015/12/31 දිනට අවසාන ශේෂය | භාණ්ඩාගාර පොත් අනුව 2015/12/31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| පොදු තැන්පත් ගිණුම් | 6000-0000-00-0001-0060-000 | | | 12,100.00 | 12,100.00 | 12,100.00 |
| | 6000-0000-00-0002-0078-000 | | | 739,710.00 | 739,710.00 | 739,710.00 |
| | 6000-0000-00-0011-0602-000 | 300,000,000.00 | | | 300,000,000.00 | 300,000,000.00 |
| | 6000-0000-00-0013-0079-000 | | 356,934.76 | 21,559,650.48 | 21,202,715.72 | 21,202,715.72 |
| | 6000-0000-00-0016-0027-000 | | 7,802,326.81 | 135,995,064.14 | 128,192,737.33 | 128,192,737.33 |
| | 6000-0000-00-0017-0009-000 | | | 88,920.00 | 88,920.00 | 88,920.00 |
| | 6000-0000-00-0018-0038-000 | | 295,400.00 | 4,444,015.46 | 4,148,615.46 | 4,148,615.46 |
| | 6000-0000-00-0053-0000-000 | 281,600,872.02 | 763,140,108.08 | 481,473,463.73 | 65,772.33 | 65,772.33 |

# වැඩසටහන් අනුව කාර්ය සාධනය - 2015

**වියදම් ශීර්ෂ අංකය** : - **277, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොනරාගල**
**වැඩසටහන් අංකය හා නාම** : - **01, මෙහෙයුම් වැඩසටහන**

## පුනරාවර්තන හා මූලධන වියදම් සාරාංශය

| වියදමෙහි ස්වභාවය | (1) | (2) | (3) | (4) | (5) | (6) |
|---|---|---|---|---|---|---|
| | වාර්ෂික අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම් | පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් | මු.රෙ.66 හා 69 අනුව මාරුකිරීම් | මුළු ශුද්ධ වෙන්කිරීම් | මුළු වියදම් | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම් |
| | රු . | රු. | රු. | රු. | රු. | රු. |
| (අ) පුනරාවර්තන | 342,250,000 | 87,300,000 | 13,718,720<br>-13,718,720 | 429,550,000 | 429,384,046 | 165,954 |
| (අ) මූලධන | 47,500,000 | 6,267,000 | 3,500,000<br>-3,500,000 | 53,767,000 | 45,199,193 | 8,567,807 |
| මුළු එකතුව | 389,750,000 | 93,567,000 | 0 | 483,317,000 | 474,583,239 | 8,733,761 |

# ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම්

වියදම් ශීර්ෂ අංකය : - 277, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොනරාගල
වැඩසටහන් අංකය හා නාමය : - 01 , මෙහෙයුම් වැඩසටහන

| ව්‍යාපෘති අංකය/ නම,පෞද්ගලික පඩිනඩි හා අනෙකුත් අයකිරීම් | (1) වාර්ෂික අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම් | (2) පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් | (3) මු.රෙ. 66 හා 69 අනුව මාරුකිරීම් | (4) මුළු ශුද්ධ වෙන්කිරීම් | (5) මුළු වියදම් | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම් |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| <u>ව්‍යාපෘති අංකය:1 හා නම:</u> <u>සාමාන්‍ය පරිපාලනය හා ආයතන සේවා</u> <u>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය</u> | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 29,600,000 | 6,000,000 | 2,445,444<br>-2,445,444 | 35,600,000 | 35,434,046 | 165,954 |
| අනෙකුත් වියදම් | 23,250,000 | | -2,400,000<br>900,000 | 21,750,000 | 21,750,000 | 0 |
| උප එකතුව | 52,850,000 | 6,000,000 | -1,500,000 | 57,350,000 | 57,184,046 | 165,954 |
| ව්‍යාපෘති අංකය :2 හා නම : ප්‍රාදේශීය ලේකම් කාර්යාල | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 248,000,000 | 81,300,000 | 8,173,276<br>-8,062,551 | 329,410,725 | 329,410,725 | 0 |
| අනෙකුත් වියදම් | 41,400,000 | | -810,725<br>2,200,000 | 42,789,275 | 42,789,275 | 0 |
| උප එකතුව | 289,400,000 | 81,300,000 | 1,500,000 | 372,200,000 | 372,200,000 | 0 |
| මුළු එකතුව | 342,250,000 | 87,300,000 | 0 | 429,550,000 | 429,384,046 | 165,954 |

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය : - 277, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොනරාගල
වැඩසටහන් අංකය හා නාම : - 01, මෙහෙයුම් වැඩසටහන
ව්‍යාපෘති අංකය හා නම : - 1, සාමාන්‍ය පරිපාලනය හා ආයතන සේවා

| වැය විෂයය | අයිතම අංකය | මූල්‍ය මාර්ගය | අයිතම් විස්තරය | වාර්ෂික අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම් | පරිපූරක /මු.රෙ. 66 හා 69 අනුව වෙන්කිරීම් | මුළු ශුද්ධ වෙන්කිරීම් | මුළු වියදම් | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම් |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | 1 | 2 | 3 | 4 | 5 |
| | | | | රු. | රු. | රු. | රු. | රු. |
| | | | මූලධන වත්කම් පුන.හා අළුත් වැඩියාව | | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි පුන. හා අළුත් වැඩියාව | 7,500,000 | | 7,500,000 | 7,500,000 | 0 |
| 2002 | | 11 | යන්ත්‍ර අළුත් වැඩියාව | 1,500,000 | | 1,500,000 | 1,500,000 | |
| 2003 | | 11 | වාහන අළුත් වැඩියාව | 1,000,000 | | 1,000,000 | 1,000,000 | |
| | | | මූලධන වත්කම් අත්පත්කර ගැනීම | | | | | |
| 2102 | | 11 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 4,000,000 | 3,500,000 | 7,500,000 | 7,500,000 | |
| 2103 | | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 4,800,000 | -3,500,000 | 1,300,000 | 1,300,000 | |
| 2104 | | 11 | ගොඩනැගිලි ඉදිකිරීම් | 27,500,000 | 6,267,000 | 33,767,000 | 25,199,193 | 8,567,807 |
| | | | හැකියා වර්ධනය | | | | | |
| 2401 | | 11 | පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 500,000 | | 500,000 | 500,000 | |
| | | | මූලධන වියදම් එකතුව | 46,800,000 | 6,267,000 | 53,067,000 | 44,499,193 | 8,567,807 |

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය : - 277 , දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොනරාගල
වැඩසටහන් අංකය හා නාම : - 01, මෙහෙයුම් වැඩසටහන
ව්‍යාපෘති අංකය හා නම : - 2, ප්‍රාදේශීය ලේකම් කාර්යාල

| වැය විෂයය | අයිතම අංකය | මූල්‍ය කාර්ය | අයිතම් විස්තරය | වාර්ෂික අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම් (1) රු. | පරිපූරක /මු.රෙ. 66 හා 69 අනුව වෙන්කිරීම් (2) රු. | මුළු ශුද්ධ වෙන්කිරීම් (3) රු. | මුළු වියදම් (4) රු. | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම් (51) රු. |
|---|---|---|---|---|---|---|---|---|
| | | | හැකියා වර්ධනය | | | | | |
| 2401 | | 11 | පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 700,000 | 0 | 700,000 | 700,000 | 0 |
| | | | මූලධන වියදම් | 700,000 | 0 | 700,000 | 700,000 | 0 |

# වියදම් මූලාශ්‍රකරණ සාරාංශය

වියදම් ශීර්ෂ අංකය : - 277, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොනරාගල

වැඩසටහන් අංකය හා නාමය : - 01, මෙහෙයුම් වැඩසටහන

| මූලාශ්‍රකරණය | | වැඩසටහන 1 | | වැඩසටහන 2 | | මුළු එකතුව | | වියදමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|
| සංකේතය | විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදන | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | |
| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | |
| | | රු: | රු: | රු: | රු: | රු: | රු: | |
| 11 | දේශීය අරමුදල් | 483,317,000 | 474,583,239 | - | - | 483,317,000 | 474,583,239 | 98 |
| 12 | විදේශීය ආධාර හා ණය | | | | | | | |
| 13 | විදේශීය ආධාර හා ප්‍රදාන | | | | | | | |
| 14 | ප්‍රතිපූර්ණය කළ හැකි විදේශීය ආධාර-ණය | | | | | | | |
| 15 | ප්‍රතිපූර්ණය කළ හැකි විදේශීය ආධාර-ප්‍රදාන | | | | | | | |
| 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | | | |
| 17 | විදේශීය ආධාර සම්බන්ධ දේශීය අරමුදල් | | | | | | | |
| 21 | විශේෂ නීතිසේවා | | | | | | | |
| එකතුව | | 483,317,000 | 474,583,239 | - | - | 483,317,000 | 474,583,239 | 98 |

# වියදම් මූල්‍යකරණය

වියදම් ශීර්ෂ අංකය : - 277, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොනරාගල

වැඩසටහන් අංකය හා නාම : - 01, මෙහෙයුම් වැඩසටහන

| මූල්‍යකරණය | | වියාපෘතිය 1 | | වියාපෘතිය 2 | | වැඩසටහන් එකතුව | |
|---|---|---|---|---|---|---|---|
| සංකේතය | විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම |
| | | | | | | | |
| | | රු: | රු: | රු: | රු: | රු: | රු: |
| 11 | දේශීය අරමුදල් | 110,417,000 | 101,683,239 | 372,900,000 | 372,900,000 | 483,317,000 | 474,583,239 |
| 12 | විදේශීය ආධාර හා ණය | | | | | | |
| 13 | විදේශීය ආධාර හා ප්‍රදාන | | | | | | |
| 14 | ප්‍රතිපූර්ණය කළ හැකි විදේශීය ආධාර-ණය | | | | | | |
| 15 | ප්‍රතිපූර්ණය කළ හැකි විදේශීය ආධාර-ප්‍රදාන | | | | | | |
| 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | | |
| 17 | විදේශීය ආධාර සම්බන්ධ දේශීය අරමුදල් | | | | | | |
| 21 | විශේෂ නීතිසේවා | | | | | | |
| එකතුව | | 110,417,000 | 101,683,239 | 372,900,000 | 372,900,000 | 483,317,000 | 474,583,239 |